# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ඇබෑර්තු - 2025

---

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත් අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ 2025 මාර්තු මස 17 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ ද ලබා ගත හැක).

**සටහන: ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කිරීම අනිවාර්ය වේ.**

## 1 අධීක්ෂක /බිල් ලිපිකරු - [ඇබෑර්තු 01]

### 1.1 රාජකාරී ස්වභාවය

නුවරඑළිය පිහිටි සෙන්පති නිවසේ බිල්පත් සකස් කිරීම සහ ගෘහපාලනය, ගෙවතු අලංකරණය හා ආහාරපාන සැපයීමේ කාර්යයන් පිළිබඳ අධීක්ෂණය.

### 1.2 මාසික වැටුප් පරිමාණය

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි වැටුප් පරිමාණය රු. 32,330 – 3 x 380/ 10 x 445/ 4 x 660– 40,560/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.83,000/- ක් පමණ වේ.)

### 1.3 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක ස්ථිර කර ඇති අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### 1.4 අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුද්ද

**(අ) අධ්‍යාපන සුදුසුකම්**

i.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය වාණිජ විෂයය ධාරාවෙන් එක් වරකදී (පැරණි නිර්දේශය) විෂයයන් 04 ක් / (නව නිර්දේශය) විෂයයන් 03 ක් සමත් වී තිබීම;

සහ

ii.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ, ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

සහ

**(ආ) වෘත්තීය සුදුසුකම්**

i.) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය මගින් හෝ රජයේ පිළිගත් වෙනත් හෝටල් පාසලක් මගින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා කාලය මාස 05කට නොඅඩු ගෘහ පාලනය සම්බන්ධ මූලික මට්ටමේ පාඨමාලාවක් හෝ ආපනශාලා සේවා සම්බන්ධ මූලික මට්ටමේ පාඨමාලාවක් (Basic Level Course in House Keeping or Basic Level Course in Restaurant and Bar Service) හදාරා සහතිකයක් ලබා තිබීම;

සහ

ii.) වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) / ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) හෝ රජය විසින් පිළිගනු ලබන වෙනත් ආයතනයක් වෙතින් පාඨමාලා කාලය මාස හයකට නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ සහතිකයක් ලබා තිබීම.

සහ

**(ඇ) පළපුරුද්ද**

සංචාරක මණ්ඩලයේ අනුමැතිය ලද නිවාඩු නිකේතනයක හෝ හෝටලයක අධීක්ෂක මට්ටමේ (Supervisory Level) තනතුරක වසර 02 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

***සටහන - පිළිගත් ආයතනයක බිල් ලිපිකරු හෝ ඒ හා සමාන තනතුරක වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.*

**1.5 <u>බඳවා ගැනීමේ ක්‍රමය</u>**

ලිඛිත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

<u>(අ) ලිඛිත පරීක්ෂණය</u>

මෙම පරීක්ෂණයේ සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය, බිල්පත් සහ ආදායම්/වියදම් ගිණුම් සකස් කිරීම හා අධීක්ෂණ කටයුතු පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලබන අතර, ලබා ගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

<u>(ආ) සම්මුඛ පරීක්ෂණය</u>

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ.
එහිදී ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව සියය (100) කි.

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

**** අධීක්ෂක / බිල් ලිපිකරු තනතුර බංගලා සේවක ගණයට අයත් වන අතර, අවශ්‍ය වුවහොත් පැය 24 මුළුල්ලේ වුවද සේවය කිරීමට සූදානම් විය යුතුය. අතිකාල දීමනා ලැබීමට හෝ රජයේ ප්‍රසිද්ධ නිවාඩු දිනවල සේවය කිරීම වෙනුවෙන් අතිරේක දීමනා හෝ වැටුප් ලැබීමට හෝ හිමිකම් නොමැත.**

## 2 රෙදිපිළි කාමර සේවක තනතුර - [ඇබෑර්තු 01]

### 2.1 රාජකාරී ස්වභාවය

පාර්ලිමේන්තු මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයෙහි නිල ඇඳුම්, තිර රෙදි ඇතුළු රෙදිපිළි වල පිරිසිදුකම සහ නඩත්තුව සහතික කිරීමට අදාළව ආහාරපාන හා ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කටයුතු ඉටු කිරීම මෙම තනතුර හරහා අපේක්ෂා කරනු ලබයි.

### 2.2 මාසික වැටුප් පරිමාණය

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9x270/10x300/6x330-32,930/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු.70,000/- ක් පමණ වේ.)

### 2.3 වයස් සීමාව

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

### 2.4 අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුද්ද

(අ) සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇගළුම් ආයතනය (Sri Lanka Institute of Textile and Apparel) හෝ වෙනත් පිළිගත් ආයතනයක් මඟින් ගෙතුම් තාක්ෂණය පිළිබඳ සහතිකයක් (Certificate in Knitting Technology) ලබා තිබීම

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුමත තරු පන්තියේ හෝටලයක රෙදිපිළි කාමර සේවක තනතුරෙහි හෝ රෙදි සේදුම් කර්මාන්ත සේවකයෙකු ලෙස වසරකට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම

හෝ

(ආ) සිංහල හෝ දෙමළ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් ද, ගණිතය සහ ඉංග්‍රීසි යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ද සහිතව අ.පො.ස. (සා. පෙළ) විභාගය විෂයයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ අනුමත තරු පන්තියේ හෝටලයක රෙදිපිළි කාමර සේවක තනතුරෙහි හෝ රෙදි සේදුම් කර්මාන්ත සේවකයෙකු ලෙස වසර 2 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම

****ඉහත සුදුසුකම් වලට අමතරව මැහුම් ගෙතුම් පිළිබඳව ප්‍රායෝගික දැනුම අනිවාර්ය වේ.**

**2.5 බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත/වෘත්තීය පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(අ) ලිඛිත/වෘත්තීය පරීක්ෂණය

උක්ත තනතුර සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් මෙම ලිඛිත/වෘත්තීය පරීක්ෂණයට මුහුණ දිය යුතුය. මෙහිදී රෙදිපිළි ගබඩා කිරීම, රෙදිපිළි සේදීම, රෙදි මැසීම යන ක්ෂේත්‍රයන්ට අදාළව අයදුම්කරුවන්ගේ කුසලතා නිර්ණය කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී පැය 1 ක ලිඛිත/වෘත්තීය පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එකී පරීක්ෂණය සඳහා ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ආ) සම්මුඛ පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි:

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

## 3 උද්‍යාන නඩත්තු සහායක තනතුර - [ඇබෑර්තු 02]

**3.1 රාජකාරී ස්වභාවය**

පාර්ලිමේන්තුවේ උද්‍යානය, ගස්, පැල, හරිත නිවාස නඩත්තු කිරීමට අදාළ රාජකාරි ඉටු කිරීම සහ ගෘහස්ථ අලංකරණය සඳහා විසිතුරු පැල සැකසීම සහ ස්ථානගත කිරීමට අදාළව ආහාරපාන හා ගෘහපාලන සේවා දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරී කටයුතු ඉටු කිරීම මෙම තනතුර හරහා අපේක්ෂා කරනු ලබයි.

**3.2 මාසික වැටුප් පරිමාණය**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු. 25,520-9x270/10x300/6x330-32,930/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම තනතුරට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 70,000/- ක් පමණ වේ.)

**3.3 වයස් සීමාව**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කර ඇති අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ).

**3.4 අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුද්ද**

(අ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම.

සහ

උද්‍යාන නඩත්තු ක්ෂේත්‍රය් හෝ තවාන් කළමනාකරණ ක්ෂේත්‍රයේ NVQ Level II සහතිකය ලබා තිබීම.

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව උද්‍යානකරණය/උද්‍යාන නඩත්තුව/තවාන් කළමනාකරණය යන ක්ෂේත්‍රවල මාස හයකට නොඅඩු පළපුද්දක් ලබා තිබීම.

**හෝ**

(ආ) සිංහල හෝ දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06කින් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්ව තිබීම

සහ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් අනතුරුව රජයේ උද්භිද උද්‍යානයක උද්‍යානකරණය/උද්‍යාන නඩත්තුව/තවාන් කළමනාකරණය යන ක්ෂේත්‍රවල අවුරුදු පහකට නොඅඩු පළපුද්දක් ලබා තිබීම

**3.5 බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත සහ වෘත්තීය පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

(අ) ලිඛිත සහ වෘත්තීය පරික්ෂණය

උක්ත තනතුර සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් අතුරින් සුදුසුකම් ලත් අයදුම්කරුවන් මෙම ලිඛිත සහ වෘත්තීය පරික්ෂණයට මුහුණ දිය යුතුය. මෙහිදී උද්‍යානකරණය,උද්‍යාන නඩත්තුව, තවාන් කළමනාකරණය යන ක්ෂේත්‍රයන්ට අදාළව අයදුම්කරුවන්ගේ කුසලතා නිර්ණය කිරීම සිදු කරනු ලැබේ. මෙහිදී පැය 1 බැගින් වූ ලිඛිත හා වෘත්තීය පරික්ෂණයක් පැවැත්වීමට කටයුතු කරනු ලැබේ. එක් පරික්ෂණයක් සඳහා ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි.

(ආ) සම්මුඛ පරීක්ෂණය

පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පහත සඳහන් නිර්ණායක පාදක කර ගනිමින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වනු ලැබේ. එහිදී ලබාගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය සියය (100) කි:

| අනු අංකය | විෂයය ක්ෂේත්‍රය |
|---|---|
| 1 | අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් |
| 2 | විෂය දැනුම |
| 3 | පළපුරුද්ද |
| 4 | පෞරුෂත්වය හා සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතා |

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතුය. තෝරාගනු ලබන අයදුම්කරුවන් මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබයි. රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත, තනතුරක සේවය කරනු ලැබූ අයදුම්කරුවකු හෝ පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්යය මණ්ඩලයේ සේවයේ ස්ථිර කරනු ලැබූ අයදුම්කරුවකු තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය වසරක (01) වැඩ බැලීමේ කාලයකට යටත්ව පත්කරනු ඇත.

(ii) පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පාර්ලිමේන්තුවේ මහ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පාර්ලිමේන්තුවේ මහ ලේකම්ට බලය ඇත.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරුවන්, වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදලට ඔහුගේ/ඇයගේ වැටුපෙන් රජය විසින් තීරණය කරනු ලබන ප්‍රතිශතයකින් දායකත්වය ලබා දිය යුතුය.

(v) තෝරාගත් අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(vi) තෝරාගත් අයදුම්කරුවන් පත්කිරීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිෂ්කාශන වාර්තාවක් ලබා ගැනීම සිදු කරනු ඇත.

5. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් සිය අයදුම්පත්වලට (**මුල් පිටපත් නොවේ**) ඇමිණිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.

(i). උප්පැන්න සහතිකය
(ii). අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(iii). වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතික
(iv). පළපුරුද්ද සනාථ කෙරෙන සහතික

6. රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා හරහා එවිය යුතුය.

7. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

8. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ සාවද්‍ය යැයි යමෙකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

9. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ, සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් හරහා යොමු කරනු නොලබන හෝ ආදර්ශ ආකෘති පත්‍රය ප්‍රකාරව පිළියෙළ නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**කුෂානි රෝහණදීර**
පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2025 -------------- මස ----- වැනි දින

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# ආදර්ශ අයදුම්පත්‍රය

# ඇබෑර්තු - 2025

---

---------------------------------------------------------------------- තනතුර

1. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..........................................................................................

   (ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) : ..........................................................................................

   (ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) : (මහතා/මහත්මිය) ............................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

3. (අ) (i) පෞද්ගලික ලිපිනය : ..........................................................................................

   ..........................................................................................

   ..........................................................................................

   (ii) විද්‍යුත් ලිපිනය : ..........................................................................................

   (iii) දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (iv) Whatsapp දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (ආ) (i) කාර්යාලයීය ලිපිනය : ..........................................................................................

   ..........................................................................................

   ..........................................................................................

   (ii) දුරකථන අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

   (ඇ) විභාග ප්‍රවේශ පත්‍රය යොමු කළ යුතු ලිපිනය සඳහන් කරන්න.

   පෞද්ගලික ☐ රාජකාරී ☐

4. (අ) උපන් දිනය : වර්ෂය .............. මාසය.............. දිනය ..............

   (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා තිබිය යුතු ය)

   (ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු .............. මාස .............. දින ..............

5. විවාහක/අවිවාහක බව : ..........................................................................................

6. ස්ත්‍රී /පුරුෂ භාවය : ..........................................................................................

7. ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව : (ඔව්/ නැත)

8. අධ්‍යාපන සුදුසුකම් (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)

| විභාගය | විෂයයන් | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|---|
| අ.පො.ස. (උ/ පෙළ) | | | |
| | | | |
| | | | |
| | | | |
| අ.පො.ස. (සා/ පෙළ) | සිංහල / දෙමළ | | |
| | ගණිතය | | |
| | ඉංග්‍රීසි | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

9. වෘත්තීය සුදුසුකම් (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)

| පාඨමාලාව | ආයතනය | ක්‍රියාත්මක වන දිනය **(Effective date)** |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

10. වෙනත් සුදුසුකම් (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)

.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

11. පළපුරුද්ද (සහතික පිටපත් අමුණා තිබිය යුතු ය)

| ආයතනය | තනතුර | සේවා කාල සීමාව |
|---|---|---|
| | | |
| | | |
| | | |

12. වත්මන් රැකියාව පළිබඳ විස්තර

(අ) ආයතනයේ නම හා ලිපිනය : ...........................................................................

(ආ) මුල් පත්වීමේ දිනය : ...........................................................................

(ඇ) දැනට දරන තනතුර : ...........................................................................

(ඈ) මාසික මූලික වැටුප : ...........................................................................

(ඉ) දීමනා : ...........................................................................

(ඊ) දළ වැටුප : ...........................................................................

13. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත්ද? (ඔව්/ නැත)

එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න : ...........................................................................

.......................................................................................................................................

14. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේද? (ඔව්/ නැත)
එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න : ...............................................................................
.........................................................................................................................................................

*ම විසින් මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුසුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමටත් හේතු වන බව දනිමි.*

දිනය : ................................. ............................................................
අයදුම්කරුගේ අත්සන

| දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ නිර්දේශය |
|---|

**රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ........................................ තනතුර දරන ........................................................ මයා/මිය/මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති/නොමැති බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න)

දිනය : ..................................... ............................................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)